# මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදායට අයත් චිත්‍ර තුළින් නිරූපිත දේව සංකල්පය පිළිබඳ අධ්‍යයනයක්

**එන්.ඩබ්.ඩබ්.වී.එච්. සාරංග[1*] හා ඩී.ජී.ජ්.එස්. සමරසිංහ[2]**

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.

[*]osankairo@gmail.com

ප්‍රමුඛ පද : දේව සංකල්පය, බිතු සිතුවම්, ජාතක කතා, ක්‍රිස්තියානි ආගම, ස්තූප

මානව ශිෂ්ටාචාරයේ ආරම්භය සිදු වූයේ කවදාද ඒ හා දිගු ඉතිහාසයක් දේව සංකල්පයට හිමි වේ. සතුන් දඩයම් කරමින් සරල දිවිපෙවතක් ගෙවූ මිනිසා වනාන්තරවල ජීවත් වූ අවධියෙහි දේව සංකල්පය පළමුවෙන් ම ඇති විය. ශ්‍රී ලාංකේය චිත්‍ර කලාව තුළ මහනුවර යුගයේ පහතරට බිතු සිතුවම් තුළ දේව සංකල්පය නිරූපණය කර ඇති අයුරු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ. ලාංකේය සිතුවම් කලාවේ අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා විකාශනය වීමේ දී විවිධ අවස්ථාවල දේව රූප සිතුවමට නගා ඇති බවක් දක්නට ලැබේ. මහනුවර යුගයේ සිතුවම් පිළිබඳ ව අවධානය යොමුකරන කලාකරුවන් එය ශෛලීන් දෙකකට බෙදා දක්වයි. එනම් උඩරට ශෛලිය හා පහතරට ශෛලිය වශයෙනි. මහනුවර යුගයේ පහතරට මෙන්ම උඩරට ද දේව සංකල්පය නොතිබුණා නොවේ. උඩරට ශෛලිය අන්තර්ගත සිතුවම් රාශියක් විහාරාරාමවල දැකගත හැකි අතර ඒවායේ බහුලව දේව සංකල්පය නිරූපණය කර ඇති බවක් දක්නට නොලැබේ.

ලංකාව 16 වැනි සියවසේ සිට පිළිවෙලින් පෘතුගීසී, ලන්දේසි, ඉංග්‍රීසි යන විදේශීය ජාතිකයන්ගේ ග්‍රහණයට හා තර්ජනයට ලක් වූ අතර ඉන් අනතුරුව පැවතියේ දැඩි වියවුල්කාරී තත්ත්වයකි. මේ තත්ත්වය මත බෞද්ධාගම මෙන්ම වෙහෙර විහාරස්ථාන ද සිංහල ජාතිය ද පිරිහීමට ලක්විය. පෘතුගීසීන් ගෙන ගිය දැඩි බෞද්ධාගමික විරෝධී වැඩ පිළිවෙල හේතුවෙන් අපට පැරණි වෙහෙරවිහාර රාශියක් අහිමි විය. ඔවුන් කොල්ලකෑම් හා ගිනි තබා විනාශ කිරීම් බෙහෙවින් සිදු කළ අතර බෞද්ධ භික්ෂුව අවමානයට පත් කරන ලදි. අටලොස් වැනි සියවසේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් බුද්ධාගමට කරන ලද මෙහෙවර තුළ බෞද්ධ පුනර්ජීවනයක් ඇති විය. එකී ප්‍රබෝධය තුළ බෞද්ධ සන්නිවේදන මාධ්‍යයක් ලෙස සිතුවම් කලාව විහාරාරාම ආශ්‍රිතව දේව සංකල්පය, ජාතක කතා ආදිය යොදා ගනු ලැබූහ. එම තේමාවන් තෝරා ගැනීමේ දී සමකාලීනව බුදු දහමට අත් වී තිබූ ඛේදනීය තත්ත්වය එමගින් මුදවා ගැනීම එහි මුඛ්‍ය පරමාර්ථය වී ඇත. බෞද්ධ ජනතාව හා භික්ෂූන්

වහන්සේලා අතර පැවති සම්බන්ධතාව තවදුරටත් පවත්වාගෙන යාමේ ඉඩ ප්‍රස්ථා පැවති දේශපාලනික තත්ත්වය මත ඇහිරී යන යුගයක් මේ තුළ පැවතිණි. මිනිසුන්ගේ සාරධර්ම වියැකී ගොස් බටහිර සංස්කෘතියට ගැතිව කටයුතු කරන්නට විය. මෙම තත්ත්වය මග හරවා ගැනීමට අවශ්‍ය අවවාද අනුශාසනා නිරන්තරව ලබා දීමට භික්ෂූන් වහන්සේට ඉඩ ප්‍රස්තාව අහි කොට ඇත. බෞද්ධාගමික ධර්ම කරුණු මිනිසුන් වෙතට කාවැද්දීම උදෙසා දේව සංකල්පය නිරූපිත සිතුවම් මගින් කරනු ලබන කාර්යභාරය මේ මගින් අධ්‍යයනය කෙරේ.

මහනුවර යුගයට අයත් පහතරට විහාර සිතුවම් අතර දේව සංකල්පය නිරූපිත අවස්ථාවන් ලෙස

- සිද්ධාර්ථ කුමාර උත්පත්තියේ සිට බෝසත් අවධිය
- බුද්ධ චරිතයේ විවිධ අවස්ථා හා සිදුවීම්
- දිව්‍යලෝක සිතුවම් කිරීම හා ඒවායේ දෙවිවරු දිව්‍ය සැප සම්පත් විඳින අයුරු
- යහපත් ක්‍රියා කළ අප මරණින් මතු දිව්‍ය ලෝකවල උත්පත්තිය ලබන බව සිතුවම් කිරීම
- යහපත් ක්‍රියා කරන අයට දෙවිවරු පිහිටවීම
- සතරවරම් දෙවිවරු මෙන්ම ලංකාවේ ප්‍රසිද්ධ යැයි සලකන දෙවිවරු සිතුවමට නැගීම
- ආයු නමස්කාරය කිරීම / පිරිනිවන් පෑම

මහනුවර අවධියේ මේ රටට එල්ල වුණු විදේශීය ආක්‍රමණ බුදු දහමටත්, බෞද්ධ සංස්කෘතියටත් ප්‍රබල තර්ජනයක් වූ බව පෙනේ. වෙහෙරවිහාර විනාශ කරමින් හින්දු සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට උත්සුක වූ ද්‍රවිඩ ආක්‍රමණිකයන්ගේ විනාශකාරී පිළිවෙත බෞද්ධ සමාජ සංවිධානවලට හානි වූවා පමණක් නොව එය බෞද්ධයාගේ සිත්සතන් පුබුදුවා ලීමට හේතුවක් විය. මෙය වටහාගත් බෞද්ධ භික්ෂූන් වහන්සේලා සත්‍යඅසත්‍ය හොඳනරක පිළිබඳව යථා අවබෝධයක් ජනතාවට ලබාදීමට අවැසි බව අවබෝධ කරගත්හ. ඒ අනුව බුදුන් වහන්සේගේ හා රහතන් වහන්සේලාගේ ධාතු තැන්පත් කොට ඉදිකරන ලද ස්තූප වලට දෙවිදේවතාවුන් වන්දනාමාන කරන අයුරු විහාර බිතුසිතුවම් වල චිත්‍රනය කළහ. වෙහෙරවිහාර කඩා බිඳ දැමීමෙන් නරකාදී අපායවල උපත ලබන බවත් ලැගුම් ගෙයක් කරවා භික්ෂූන් වස් සිටුවා අටපිරිකර ආදිය පිදීමෙන් දිව්‍ය විමානවල උපත ලබන බවත් දක්වෙන සිතුවම් චිත්‍රණය කර ඇත. යහපත් ක්‍රියා කරන අය දිව්‍ය විමාන ලබන බවත් අයහපත් ක්‍රියා කරන අය අපගාමී වන බවත් මහනුවර යුගයේ පහතරට විහාර බිතුසිතුවම් තුළ බහුල වශයෙන් නිරූපණය කරයි. මේ හරහා බෞද්ධ ජනතාව බුදුදහම, වෙහෙරවිහාර ආරක්ෂා කිරීමට පෙළඹවීමක් ඇති කිරීමටත් ක්‍රිස්තියානි ආගමේ අසත්‍ය ප්‍රචාරයන්ට රැවටී බුදු දහම අමතක කර එම ආගමට නැඹුරුවීම වැළැක්වීමටත් උත්සාහ ගෙන ඇත. සමුද්‍රගිරි විහාරය, කරගම්පිටිය

සුබෝධාරාම විහාරය, තොටගමුව විහාරය, මුල්කිරිගල විහාරය ආදී විහාරවල මහනුවර යුගයට අයත් පහතරට ශෛලිය අන්තර්ගත සිතුවම් රාශියක් ඇත. මෙම විහාරවල දිව්‍ය ලෝක දැක්වීමේ දී චාතුර් මහාරාජිකය, තාවතින්සය, නිම්මාණරතිය, පරනිම්මිතවසවත්තිය, යාමය, තුසිතය සහ සදෙව් ලොව නිරූපිතය. මීට අමතරව බෝධි සත්වයන් වහන්සේලා ලෙස නාථ හා මෛත්‍රී බෝසතුන් දක්වේ. විෂ්ණු, කතරගම, උපුල්වන් ආදී දෙවිවරු සිතුවම් කර ඇත. සතරවරම් දෙවිවරු ලක්දිව ආරක්ෂා කරන බවට ලක්දිව ජනහදවත් තුළ පැලපදියම් වී ඇති අදහසකි. ඒ අනුව, විහාර සිතුවම් තුළ දේව සංකල්පය සිතුවමට නැගීම බුදු දහම සුරක්ෂිත කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ගයකි.